ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත

---

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 18 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 නොවැම්බර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු.14.75 යි.                    තැපැල් ගාස්තුව : රු. 5.25 යි.

# 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1998 නොවැම්බර් මස 18 වන දින.]

එල්. ඩී.–ඕ. 15/95.

**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීමද සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1998 අංක 51 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## 1 වන කොටස

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පිහිටුවීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පිහිටුවීම.

2. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තිය යටතේ ඊට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් මණ්ඩලය විසින් ද, මණ්ඩලයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, කොළඹ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ විය යුතු ය. මණ්ඩලයේ ශාඛා කාර්යාල අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, අවශ්‍ය යයි මණ්ඩලය සලකන යම් ස්ථානවල පිහිටුවනු ලැබිය හැකි ය.

මණ්ඩලය සංස්ථාපනය කිරීම.

3. (1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) උසස් හා පොදු අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් සත් දෙනෙක් : අමාත්‍යවරයා විසින්, ඔවුන් අතුරින් එක් තැනැත්තකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

D 049766—5,900 (98/08)

(ආ) නිල බලයෙන් පත් වන සාමාජිකයන් සත් දෙනකු හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්, එනම් :

(i) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ;

(ii) සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ;

(iii) රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ;

(iv) 1981 අංක 78 දරන පනතින් පිහිටුවන ලද ස්වභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරියේ සභාපති ;

(v) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ සභාපති;

(vi) 1984 අංක 10 දරන පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා පරිගණක සහ තොරතුරු තාක්ෂණවේද සභාවේ සභාපති ; සහ

(vii) මහා භාණ්ඩාගාරයේ නියෝජිතයකු.

(2) නිලබලයෙන් පත් වන සාමාජිකයකු බලයලත් නියෝජිතයකු මගින් මණ්ඩලයේ නියෝජනය වන අවස්ථාවක, මණ්ඩලයේ යම් රැස්වීමක දී හෝ මේ පනත යටතේ පිහිටුවන ලද වෙනත් යම් කමිටු රැස්වීමක දී උද්ගතවන සියලු කරුණු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයා වෙනුවෙන් කතා කිරීමට සහ ක්‍රියා කිරීමට, ඒ නියෝජිතයාට පූර්ණ බලය තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා සහ සෑම සාමාජිකයකු ම, කලින් ධුරය හිස් කරතහොත් මිස, අවුරුදු තුනක කාලයකට ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(4) නිල බලයෙන් පත් වූ, මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, තමා මණ්ඩලයේ සාමාජිකයකු වූයේ යම් තනතුරක් නිසා ද, ඒ තනතුර දරන තාක් කල් ධුරය දැරිය යුතු ය.

(5) මණ්ඩලයේ සාමාජිකයන්ට සහ 7 වන වගන්තිය යටතේ පත් කරන ලද, යම් කමිටුවක සාමාජිකයන්ට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමිකයක් ගෙවනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා සහ මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින්–

(අ) අමාත්‍යවරයා විසින්, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් ; හෝ

(ආ) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්

ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා වශයෙන් වූ ස්වකීය ධුරය හිස් කරන්නේ ය.

(7) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද, මණ්ඩලයේ සභාපතිවරයා හෝ සාමාජිකයකු මියයන හෝ ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ අවස්ථාවක, එසේ මියයන, ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ ඒ සභාපතිවරයා හෝ සාමාජිකයා වෙනුවට, අමාත්‍යවරයා විසින් අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ සාමාජිකයා වශයෙන්, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(8) මියගිය, ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ සභාපතිවරයා හෝ සාමාජිකයකු වෙනුවට (7) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන මණ්ඩලයේ සාමාජිකයකු, මියයාම හෝ ධුරයෙන් ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම නිසා ස්වකීය ධුරය කලින් හිස් කරනහොත් මිස, ධුරයේ ස්වකීය පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(9) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරන ලද, මණ්ඩලයේ සාමාජිකයකුට, අසනීපයක් හෝ වෙනත් දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හේතුකොට ගෙන ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා, අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(10) යම් තැනැත්තකු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් නැතහොත් එසේ පත්වන්නේ නම්, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු වන්නේ ය.

මණ්ඩලයේ කර්තව්‍ය.

4. මණ්ඩලයේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) සියලුම ප්‍රජා අංශ අතර පුස්තකාල හා ප්‍රලේඛන සේවා සඳහා වූ අවශ්‍යතාව ඇගයීම සහ පුස්තකාල හා ප්‍රලේඛන සේවා දියුණුව ප්‍රවර්ධනය කිරීම ;

(ආ) 12 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම හා පාලනය කිරීම ;

(ඇ) ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන සේවා දියුණුව සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ කටයුතු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන සේවා සම්බන්ධීකරණය කිරීම සහ ඒ සම්බන්ධයෙන් සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු සැලැස්වීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ පුස්තකාලවලට හා පුස්තකාලයාධිපතිවරුනට වෘත්තීය උපදෙස් හා පුහුණුව සැලසීම සහ ගෘහ භාණ්ඩ, උපකරණ, පුස්තකාල සහ ප්‍රලේඛන ද්‍රව්‍ය සැපයීම ඇතුළුව, කාර්මික, ද්‍රව්‍යමය හා මූල්‍යමය ආධාර ලබාදීම ;

(ඊ) ශ්‍රී ලංකාවේ පුස්තකාල හා ප්‍රලේඛන වෘත්තියේ දියුණුව ප්‍රවර්ධනය කිරීම ;

(උ) පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන්හි සියලු අංශවලට අදාළ පර්යේෂණ, සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම ප්‍රවර්ධනය කිරීම, පවත්වා ගෙන යාම හා සම්බන්ධීකරණය කිරීම ;

(ඌ) පුස්තකාල හා ප්‍රලේඛන සේවාවන්හි සියලු අංශවල ජාතික ප්‍රමිති සකස්කර, ප්‍රකාශයට පත් කිරීම ;

(එ) ප්‍රකාශන නිෂ්පාදනය, ප්‍රකාශන නිෂ්පාදනය සඳහා වෙනත් නියෝජ්‍යායතනවලට උපදෙස් සහ සහාය දීම මගින් ද, ප්‍රදර්ශන, සංදර්ශන හා වෙනත් ප්‍රවර්ධන කටයුතු මගින් ද කියවීමේ පුරුද්ද වැඩිදියුණු කිරීම ;

(ඊ) එහි වැඩවලට සම්බන්ධයෙන් වූ කවර වූ හෝ අංශවල රැස්වීම්, පාඨමාලා, ප්‍රදර්ශන හා වෙනත් කටයුතු සංවිධානය කිරීම ;

(ඔ) එහි කටයුතුවල කවර හෝ අංශවලට සම්බන්ධ තරඟ ත්‍යාග හා ප්‍රදාන ආරම්භ කිරීම හා ඒ සඳහා මූල්‍යාධාර සැපයීම; සහ

(ඕ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමෙහිලා මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික සියලු ක්‍රියා හා දේ කිරීම.

5. මණ්ඩලයට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :— මණ්ඩලයේ බලතල.

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පිහිටුවීම, කළමනාකරණය කිරීම හා පවත්වාගෙනයාම සහ මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන වෙනත් යම් පුස්තකාල හෝ ප්‍රලේඛන මධ්‍යස්ථාන පිහිටුවීම, කළමනාකරණය කිරීම හා පවත්වාගෙන යාම ;

(ආ) එහි බලතල ක්‍රියාත්මක කිරීම හෝ එහි කාර්ය එනම්, විශේෂයෙන්ම, පහත සඳහන් දේ පිළිබඳ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි, සියලු එකඟවීම්වලට හා ගිවිසුම්වලට ශ්‍රී ලංකාව තුළ හා වෙනත් ස්ථානවල දී ඇතුළුවීම සහ ඒවා ඉටු කිරීම—

(i) මුද්‍රණකරුවන් හා ප්‍රකාශන ආඥාපනත (179 වන අධිකාරය) යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රකාශන මඟින් පුස්තකාල හා ප්‍රලේඛන ද්‍රව්‍ය අත්කර ගැනීම, මිලට ගැනීම, තෑගි දීම, හා හුවමාරු කර ගැනීම :

(ii) ග්‍රන්ථ විඥාපන වාර්තා සම්පාදනය, රැස් කිරීම හා ප්‍රචාරණය :

(iii) පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථාන පිහිටුවීම, මෙහෙයවීම හා වැඩිදියුණු කිරීම සහ පුස්තකාල හා ප්‍රලේඛන සේවා සැපයීම :

(iv) පුස්තකාල හා ප්‍රලේඛන ද්‍රව්‍ය පුස්තකාල අතර බෙදාහැර දීම හා ඒවා පිටපත් කිරීම :

(v) ප්‍රකාශන පිළියෙල කිරීම, නිෂ්පාදනය කිරීම හා බෙදා හැරීම :

(vi) පුස්තකාල හා ප්‍රලේඛන කාර්ය මණ්ඩලයට හා පරිහරණය කරන්නන්ට අධ්‍යාපනය සහ පුහුණුව ලබාදීම.

(ඇ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම හා දැරීම සහ එය විකිණීම, බදුදීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම :

එසේ වුවද, මණ්ඩලයේ කිසිම නිශ්චල දේපළක් අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ පූර්ව අනුමතය නොමැතිව විකුණනු නොලැබිය යුතු ය :

(ඈ) යම් බැංකුවක ජංගම, ඉතිරි කිරීමේ හා තැන්පත් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගත යාම :

(ඉ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත යම් පුද්ගලයන්ගෙන් හෝ පුද්ගල මණ්ඩලවලින් ප්‍රදාන හෝ පරිත්‍යාග පිළිගැනීම :

(ඊ) මේ පනතින් මණ්ඩලය වෙත පිරිනැමුණු හෝ නියම කෙරුණු හෝ පැවැරුණු යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, උචිත යයි මණ්ඩලය සලකනු ලබන පරිදි, සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරීම :

(උ) මණ්ඩලයේ කර්තව්‍ය සපුරා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගතයුතු ආදායම් උපයා ගැනීමට, මණ්ඩලයේ කර්තව්‍ය හා අනනුකූල නොවන කටයුතුවල නිරතවීම ;

(ඌ) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සලකන නිලධරයන්, අනුයෝජිතයන් හා සේවකයන් සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරවීම සහ එසේ පත් කරන ලද යම් නිලධරයකු, අනුයෝජිතයකු හෝ සේවකයකු සම්බන්ධයෙන් පාලනය කිරීම හා එවැනි යම් තැනැත්තකු සේවයෙන් පහ කිරීම :

මණ්ඩලයේ සභාපති.

6. (1) මණ්ඩලයේ සභාපති මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. ඔහු නොපැමිණි විටෙක දී, යම් රැස්වීමකට පැමිණ ඇති, මණ්ඩලයේ සාමාජිකයන් විසින් තමන් අතුරින් කෙනකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා, මණ්ඩලයේ ගිණුම් නිලධරයා විය යුතු ය.

(3) 5 වන වගන්තියේ (ඊ) ඡේදය යටතේ මණ්ඩලය විසින් සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි යම් බලතල ක්‍රියාත්මක කිරීම සහ යම් කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම, ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

(4) අසනීපවීම හෝ වෙන යම් දුබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරවීම හේතුකොට ගෙන ස්වකීය ධුරයේ කාර්ය කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක දී, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(5) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වැටුපක් හෝ පාරිශ්‍රමිකයක් සභාපතිවරයාට ගෙවනු ලැබිය යුතු ය.

(6) 3 වන වගන්තියේ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය, මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්ව කාලය විය යුතු ය.

7. අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, මණ්ඩලය විසින්– කමිටු පත් කිරීම.

(අ) එහි සාමාජිකයන් අතුරින් යම් සංඛ්‍යාවක් හෝ මේ වගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් වෙනත් තැනැත්තන් යම් සංඛ්‍යාවකින් සමන්විත යම් කමිටු, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි පත් කරනු ලැබිය හැකි ය ;

(ආ) ඒ කමිටුවල නිර්ණය විෂය, බලතල, කර්තව්‍ය හා කාර්ය නිශ්චය කරනු ලැබිය හැකි ය ;

(ඇ) මණ්ඩලයේ යම් නිලධරයකු හෝ කමිටුවේ නිර්ණය විෂය පිළිබඳව අදාළ විශේෂඥ දැනුම හෝ විශේෂ සම්බන්ධතාවක් ඇති වෙනත් යම් තැනැත්තකු හෝ එවැනි යම් කමිටුවක සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැකි ය. එසේ වුවද, මණ්ඩලයේ සාමාජිකයන් නොවන ඒ තැනැත්තන්ට, 19 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලේ මුදල්වලින් යම් කොටසක් වැය කිරීමේ බලය දෙමින් හෝ බලය දීම සඳහා මණ්ඩලයෙන් ඉල්ලුම් කරමින් වූ යම් යෝජනා සම්මතයක් සම්බන්ධයෙන් ඒ කමිටු රැස්වීම්වල දී ඡන්දය දීමට හිමිකමක් නොතිබිය යුතු ය ; තවද,

(ඈ) ඒ කමිටුවල කටයුතු පවත්වාගෙන යාම සඳහා රීති සාදනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම්.

8. යටත් පිරිසෙයින් මසකට වරක්වත් මණ්ඩලය රැස්විය යුතු ය.

ගණපූරණය.

9. මණ්ඩලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙක් විය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්වල කාර්ය පරිපාටිය.

10. (1) 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලය විසින් තම රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් කාර්ය පරිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

(2) 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු ය. ලේකම්, මණ්ඩලයේ සියලු රැස්වීම්වලට පැමිණිය යුතු අතර, ඒ රැස්වීම්වල වාර්තා තැබිය යුතු ය. එවැනි යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකමක් නොමැත.

(3) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටෙක දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කවර අවස්ථාවක දී වුවද, යටත් පිරිසෙයින් මණ්ඩලයේ සාමාජිකයන් සතර දෙනකු විසින් ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමක් මත මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණ අවශ්‍ය වන සියලු කාරණා, පැමිණ ඇති සාමාජිකයන්ගේ බහුතරයක ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමතාවක් ඇති වූ විටෙක, මණ්ඩලයේ ඒ රැස්වීමේ මුලසුන දරන සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට, තම ඡන්දයට අතිරේකව, තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(5) මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ නීති කෘත්‍යයක්, එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ දී සිදුවන යම් දෝෂයක් හෝ සමණක් හේතු කොටගෙන බලරහිත නොවිය යුතු ය.

මණ්ඩලයේ දේපළ, මුදල් ආදිය අදාළ කර ගැනීම.

11. මණ්ඩලය විසින් අත්කරගන්නා ලද හෝ දරන ලද සියලු දේපළ සහ මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් ලබා ගන්නා ලද සියලු මුදල්, එහි කර්තව්‍ය සපුරාලීම සඳහා භාවිත කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

## ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථානය පිහිටුවීම

ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථානය පිහිටුවීම හා එහි කර්තව්‍ය.

**12.** (1) මණ්ඩලයේ කළමනාකරණය හා පාලනය යටතේ (මෙහි මින් මතු 'මධ්‍යස්ථානය' යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) 4 වන වගන්තියේ විධිවිධානවලට යටත් ව, මධ්‍යස්ථානයේ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) සියලුම ජන කොටස්වල භාවිතය සඳහා, ඔවුන්ගේ අවශ්‍යතාවලට උචිත පුස්තකාල සහ ප්‍රලේඛන සම්පත් පිළිබඳ ජාතික සංචිතයක් ලබාදීම ;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන ද්‍රව්‍ය සංචිතයක් පිහිටුවීම, වැඩිදියුණු කිරීම හා පවත්වාගෙනයාම මගින් ශ්‍රී ලංකාවේ ජාතික හා සංස්කෘතික උරුමය සංරක්ෂණය කිරීම ;

(ඇ) (179 අධිකාරය වන) මුද්‍රණකරුවන් හා ප්‍රකාශන ආඥාපනත යටතේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රකාශනවල පිටපත් ලබා ගැනීම ;

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ ඊට අදාළව ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශනවල හෝ ශ්‍රී ලංකාවේ අවශ්‍යතාවලට අදාළ විදේශීය ප්‍රකාශනවල පිටපත් මිලට ගැනීම හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම ;

(ඉ) ජාතික ග්‍රන්ථ විඥාපන සේවාවක් සහ ශ්‍රී ලංකාවේ පුස්තකාලවල තැන්පත් වී ඇති පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ ඒකාබද්ධ සූචීන් සම්පාදනය ඇතුළු ග්‍රන්ථ විඥාපන සේවා සැපයීම :

(ඊ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ප්‍රකාශයට පත් කරන ලද ලේඛන හා ප්‍රකාශනවල ජාතික ග්‍රන්ථ විද්‍යා දත්ත සැකසුම් පිහිටුවීම හා ඇති කිරීම :

(උ) ශ්‍රී ලංකාවේ ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම ;

(ඍ) ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස්වලට තොරතුරු, යොමු කිරීම් සේවා ද ප්‍රතිකෘති සහ ලේඛනමය පර්යේෂණ සේවා සැපයීම:

(එ) ප්‍රජාවේ සියලු සාමාජිකයන්ට ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත දී ලබාගත හැකි හෝ අනාගතයේ දී ලබාගත හැකි පුස්තකාල සහ ප්‍රලේඛන සම්පත්වලට ප්‍රවේශ පහසුකම් සැලසීම :

(ඒ) ශ්‍රී ලංකා ප්‍රජාවේ සියලු කොටස්වලට සේවය කරන මහජන, පාසැල්, ශාස්ත්‍රීය, ආණ්ඩුවේ සහ වෙනත් පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථාන ජාලය ද ඇතුළුව, පුස්තකාල සහ ප්‍රලේඛන ජාල පිහිටුවීම, වැඩිදියුණු කිරීම හා පවත්වා ගෙන යාම ප්‍රවර්ධනය කිරීම, ඒ සඳහා උපදෙස් දීම හා සහායවීම :

(ඔ) පුස්තකාල ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම, පුස්තකාල අතර බැහැර දීම හා ලේඛන පිටපත් කිරීම සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා හුවමාරු කර ගැනීම ද ඇතුළුව, ජාතික හා ජාත්‍යන්තර මට්ටමින් පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථාන අතර සහයෝගිතාව හා සම්පත් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ පහසු කරලීම:

(ඕ) ශ්‍රී ලංකාවේ පුස්තකාල සහ ප්‍රලේඛන මධ්‍යස්ථානවලට නව තොරතුරු තාක්ෂණ හඳුන්වාදීම සහ කාර්යක්ෂම ලෙස භාවිත කිරීම, මධ්‍යස්ථාන කටයුතුවල දී ඒ තාක්ෂණ භාවිත කිරීම ඇතුළු කිරීම මගින් ප්‍රවර්ධනය කිරීම සහ ඒ තාක්ෂණ හඳුන්වා දීම හෝ ප්‍රවර්ධන කටයුතු පිළිබඳව වෙනත් මණ්ඩලවලට උපදෙස්, සහාය සහ පුහුණුව ලබාදීම:

(ක) මණ්ඩලයේ කර්තව්‍ය අනුව ව්‍යාපෘති ආරම්භ කිරීම සහ මණ්ඩලය විසින් කලින් කල නියම කරනු ලබන පරිදි, අවශ්‍ය පහසුකම් හා සේවා සැපයීම.

(3) මධ්‍යස්ථානයේ කර්තව්‍ය මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා වශයෙන් වූ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධානය යටතේ ඉටු කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පත් කිරීම.

මණ්ඩලයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා පත් කිරීම.

13. (1) මණ්ඩලය විසින්, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ලේකම්වරයා විය යුතු (මේ පනතෙහි 'අධ්‍යක්ෂ-ජනරාල්' යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ ජනරාල්වරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කරනු ලැබිය යුතු ය.

(2) ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩල පනත යටතේ පත් කරනු ලැබ ඇති, නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුරය දරන්නා වූ ද, විශ්‍රාමයාමේ වයසට නොපැමිණියා වූ ද ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂවරයා, ඔහු කැමැත්තේ නම්, මණ්ඩලයේ ප්‍රථම අධ්‍යක්ෂ ජනරාල්වරයා විය යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා, මණ්ඩලයේ සාමාන්‍ය විධානයට යටත්ව, මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සහ මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පාලනය භාරව සිටිය යුතු ය. තවද, මණ්ඩලයේ සියලු තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

(4) මණ්ඩලය විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි බලතල, කර්තව්‍ය හා කාර්ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ හෝ මේ පනත යටතේ පිහිටුවන ලද වෙනත් යම් කමිටුවක යම් රැස්වීමකට පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හිමිකම ඇති නමුත් ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම නොතිබිය යුතු ය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරය, මරණය නිසා හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සභාපතිවරයා වෙත ඒ සඳහා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීම නිසා හිස්වන්නේ ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.

14. (1) මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගවලට යටත්ව, මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම පිණිස මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, තත් කාර්ය සඳහා සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබ ඇති බඳවා ගැනීමේ ක්‍රම හා කාර්ය පටිපාටිය අනුව, මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගවලට යටත්ව, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික ද ඇතුළුව, මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(4) සේවයෙන් පහකිරීමේ බලය ද ඇතුළුව, මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ විනය පාලනය, මණ්ඩලයේ අධීක්ෂණයට හා අනුමතියට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ විනය පාලනය ද ඇතුළුව, යම් කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(6) මණ්ඩලය විසින්, මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සුභසිද්ධිය සඳහා අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම පිහිටුවා විධිමත් කරනු ලැබිය හැකි අතර එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට මණ්ඩලය විසින් දායක මුදල් ගෙවනු ලැබිය හැකි ය.

රජයේ නිලධරයන් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

15. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට, රජයේ සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා අමාත්‍යවරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරුන්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට, යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු, ඒ නිලධරයාගේ හා අමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ සහ පළාත් සභා විෂය භාර අමාත්‍යවරයාගේ ද කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක් සඳහා මණ්ඩලයට අනුයුක්ත කරනු ලැබිය හැකි ය.

(3) රජයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) රජයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

ඇතැම් ගිවිසුම්වල කාර්ය සඳහා මණ්ඩලයට කරන සේවය රජයට කරන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

16. නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරවන යම් අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ බලතල අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත පැවරීම.

17. (1) මණ්ඩලය විසින්, එහි යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කිසියම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබූ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ බලය කාර්යය හෝ කර්තව්‍යය මණ්ඩලයේ විධානවලට යටත්ව, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව.

18. මණ්ඩලයේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) මණ්ඩලයේ බලය ඇති ද මණ්ඩලයේ සාමාජිකයකු හා අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට දී ද හැර, කවර වූ හෝ සාධන පත්‍රයකට තබනු නො ලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රය අත්සන් කළ යුතු ය. එසේ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

## IV වන කොටස

## මුදල්

මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය.

**19.** (1) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය, තත් කාර්ය සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මත මණ්ඩලයට ප්‍රදානය කරනු ලබන මුදල් ප්‍රමාණයකින් සමන්විත විය යුතු ය.

(2) මණ්ඩලයේ ප්‍රාග්ධනය, යම් විසර්ජන පනතකින් හෝ යම් පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් බලය දෙන පරිදි වූ මුදල් ප්‍රමාණයන්ගෙන් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ අරමුදල.

**20.** (1) මණ්ඩලයට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට —

(අ) මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන, මුදල්;

(ආ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් බැහැර හෝ කවරාකාර වූ හෝ යම් ප්‍රභවයකින් ණය මුදල්, පරිත්‍යාග, ත්‍යාග හෝ ආධාර මුදල් මාර්ගයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල්; සහ

(ඈ) 32 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අරමුදලට පවරනු ලබන සියලු මුදල්

බැරකරනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ අරමුදලින් —

(අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවීමට නියම කරනු ලැබ ඇති සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

21. මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මණ්ඩලයේ මුදල් වර්ෂය.

22. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම හා සම්බන්ධව අදාළ විය යුතු ය. ගිණුම් විගණනය කිරීම.

V වන කොටස

පොදු විධිවිධාන

23. (1) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් කලින් කල අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත ලිඛිතව පොදු විධාන දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. මණ්ඩලයට අදාළව අමාත්‍යවරයා සතු බලතල.

(2) මණ්ඩලයේ යම් කටයුත්තක් හෝ සියලු කටයුතු, අමාත්‍යවරයා විසින් නිශ්චිතව නම් කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කර වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබූ විට, මණ්ඩලය විසින් ඒ නියමය ඉටු කිරීම පිණිස අවශ්‍ය විය හැකි සියලු පහසුකම් ලබාදීම සහ සියලු තොරතුරු සපයාදීම කරනු ලැබිය යුතු ය.

24. තත් කාලයේ රජයේ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, යම් රජයේ ඉඩමක් හෝ රජයේ ගොඩනැගිල්ලක්, මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් නේවාසික ස්ථානයක් ලෙස භාවිත කරනු ලැබීම ද ඇතුළුව, මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා ලබාදීම හෝ සතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය. රජයේ ඉඩම් හෝ ගොඩනැගිලි මණ්ඩලයට ලබාදීම.

25. මණ්ඩලයේ එක් එක් මුදල් වර්ෂය අවසානවීමෙන් පසු මාස හයක කාලයක් ඉකුත්ව යාමට ප්‍රථමයෙන්, මණ්ඩලය විසින්, ඒ වර්ෂය තුළ මණ්ඩලයේ කටයුතු පිළිබඳ සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වාර්තාවක් අමාත්‍යවරයා වෙත යවනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් එහි පිටපත් පාර්ලිමේන්තුවෙහි සභාගත කරනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින් එහි කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතු බව.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථය ඇතුළත උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු

**26.** මණ්ඩලය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් සහ නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**27.** මණ්ඩලයේ සියලු සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ ගන්නා ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**28.** (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මණ්ඩලයේ සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි ගෙනෙන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බවට අධිකරණය විසින් තීරණය කරතහොත් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

**29.** (1) පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඒවායින් යම් කාරණයක් ගැන අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් බඳවාගැනීමේ ක්‍රම සහ ඔවුන් පත් කිරීම සඳහා කාර්ය පටිපාටිය:

(ආ) වැටුප්, වේතන සහ වෙනත් පාරිශ්‍රමික ද ඇතුළුව මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම සහ කොන්දේසි:

(ඇ) අර්ථසාධක අරමුදල් සහ මණ්ඩලයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සුභසිද්ධිය සඳහා යෝජනා ක්‍රම.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළකිරීමේ දිනයේ දී හෝ ඒ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පසු දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියෙහි තැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් එය අනුමත නොකළ දිනයේ සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කරන ලද යම් දෙයකට හානියක් නොවිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

මාණ්ඩලීය රීති.

**30.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය:—

(අ) මේ පනත යටතේ පිහිටුවන ලද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ කටයුතු කරගෙන යාම ඇතුළුව, මණ්ඩලයේ සහ, මණ්ඩලය විසින් පත් කරන ලද කමිටුවල සහ මේ පනත යටතේ කලින් කල පිහිටුවනු ලැබිය හැකි වෙනත් යම් පුස්තකාලයක හෝ ප්‍රලේඛන මධ්‍යස්ථානයක කටයුතු පරිපාලනය කිරීම ;

(ආ) මණ්ඩලයේ වැඩසටහන් හා යෝජනා ක්‍රම, වාර්ෂික අයවැය, වාර්තා සහ ගිණුම් සහ ඒ වැඩසටහන් හා යෝජනා ක්‍රම, වාර්ෂික අයවැය, වාර්තා සහ ගිණුම් ඉදිරිපත් කළ යුතු ආකාරය:

(ඇ) 7 වන වගන්තිය යටතේ පත් කරන ලද කාරක සභාවල වැඩකටයුතු කරගෙන යාම ; සහ

(ඈ) මේ පනතින් රීති සෑදීමට බලය දී ඇත්තේ කවර කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා.

## VI වන කොටස

### ඉවත් කිරීම හා අන්තර්කාලීන විධිවිධාන

1970 අංක 17 දරන පනත ඉවත් කිරීම.

**31.** 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පනත නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ඉවත් කරනු ලැබේ.

අන්තර්කාලීන විධිවිධාන.

**32.** (1) එසේ ඉවත් කරනු ලැබූ පනතේ 16 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉතිරි වී තිබෙන කවර හෝ මුදල්, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, මේ පනතේ 19 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය.

(2) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එසේ ඉවත් කරන ලද පනත මගින් පිහිටුවා තිබූ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සේවයේ සිටි තම තමන්ගේ විශ්‍රාමයාමේ වයස්වලට එළඹ නොසිටි සියලු නිලධරයන් හා වෙනත් සේවානියුක්තයන් ඔවුන්ගේ කැමැත්ත ඇතිව, වැටුප් හෝ වේතනවලට, සේවානියුක්තිය අවසන් කිරීමට, දීමනාවලට හෝ ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සේවයේ දී ඔවුන්ට තිබුණා වූ හෝ ඔවුන් විසින් බුක්තිවින්දා වූ වෙනත් ප්‍රතිලාභවලට අදාළ නියම ඇතුළුව, එම නියම මතම නියමිත දිනයේ සිට මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, මේ වගන්තියේ මීට පෙරාතුව ම වූ විධිවිධාන, නියමිත දිනයේ දී හෝ ඊට ප්‍රථමයෙන් රජයේ සේවයේ හෝ යම් පළාත් රජයේ සේවයක හෝ පළාත් පාලන ආයතනයක තනතුරක් හාරගන්නා වූ හෝ එවැනි තනතුරකට පත් කරන්නා වූ නිලධරයකු හෝ සේවානියුක්තයකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(3) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව, නියමිත දිනයට කලින් දරනු ලැබූ සියලු ණය, බැඳීම් හා වගකීම් ද, ලියා අත්සන් කර හෝ ඇතුළත් වී ඇති සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් හා වෙනත් සාධන පත්‍ර ද එය විසින්, ඒ සමග හෝ ඒ සඳහා කිරීමට යෙදී ඇති සියලු කාරණා සහ දේවල් ද නියමිත දිනයේ සිට, මේ පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලය විසින්, ඒ සමග හෝ ඒ සඳහා දරා ඇති ලෙස, ලියා අත්සන් කර ඇති ලෙස, ඇතුළත් වී ඇති ලෙස හෝ කිරීමට යෙදී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (අ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව නියමිත දිනයට කලින්, යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පවරා ඇති සහ එදිනට නිම නොවී පවතින සියලු සිවිල් හෝ අපරාධ නඩු, අභියාචන හෝ වෙනත් නීති කෘත්‍ය, මේ පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව දිගටම පවත්වා ගෙන යා හැකි ය.

(ආ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලයේ වාසියට හෝ ඊට විරුද්ධව නියමිත දිනයට කලින්, නිසි බලය ඇති යම් අධිකරණයක් විසින් හෝ විනිශ්චයාධි-කාරයක් විසින් කර ඇති සහ එදිනට ඉටු නොකර ඉතිරිව ඇති සියලු තීන්දු ප්‍රකාශ හෝ ආඥා, මේ පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලයේ වාසියට හෝ ඊට විරුද්ධව කරන ලද තීන්දු ප්‍රකාශ හෝ ආඥා ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒවා ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ තිබෙන මුදල් සහ නියමිත දිනය තෙක් ඒ මත උපචිත වී ඇති පොලිය ද, මේ පනත යටතේ පිහිටුවන ලද අර්ථසාධක අරමුදලට මාරු කරනු ලැබිය යුතු ය; තවද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී, ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද අර්ථසාධක අරමුදලේ සෑම දායකයකුම මේ පනත යටතේ පිහිටුවන ලද අර්ථසාධක අරමුදලේ දායකයකු ලෙස සැලකිය යුතු ය.

(ඇ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලය වෙත සතු වූ හෝ එය විසින් නීත්‍යානුකූල ලෙස මිලට ගන්නා ලද හෝ අත්කර ගන්නා ලද හෝ ඊට බදු දී ඇත්තා වූ හෝ එහි කැමැත්තක් කර ගැනීම සඳහා ලබා

ගැනීමට සලස්වා ඇත්තා වූ හෝ වෙනත් යම් ආකාරයකින් ඊට පවරනු ලැබ ඇත්තා වූ නැතහොත් නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එහි සන්තකයේ හෝ පාලනයේ තිබුනා වූ සියලු චංචල හා නිශ්චල දේපළ, ඒ දිනයේ දී ඒවාට අනුබන්ධනය වූ, ඇඳනු ලැබූ හෝ අදාළ කරනු ලැබූ නියම සහ කොන්දේසි මතම මේ පනත යටතේ පිහිටුවන ලද මණ්ඩලය වෙත සතු විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**33.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**34.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සභාපතිවරයා" යන්නෙන්, මේ පනත යටතේ පත් කරන ලද මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වේ;

"පුස්තකාල සහ ප්‍රලේඛන ද්‍රව්‍ය" යන්නෙන්, තොරතුරු හෝ සාහිත්‍ය, නිර්මාණාත්මක හෝ කලාත්මක අදහස්, ලිඛිතව, මුද්‍රණය කිරීමෙන්, සිත්තමෙන්, විද්‍යුත් නිර්මාණයෙන්, මැග්නටික් ක්‍රමයෙන් (යටපත් කෙරෙන) හෝ අන්‍යාකාරයකින් වාර්තාගත කරන, ප්‍රදර්ශනය කරන, ගබඩා කරන හෝ ප්‍රතිමූර්ති කරන යම් ආකෘතියක් අදහස් වන අතර, අත්පිටපත්, යතුරු ලියනය කරන ලද පිටපත්, පොත්, පුවත්පත්, සඟරා, සිතියම්, මයික්‍රෝපොර්ම්, සංගීත, ඡායාරූප, මුද්‍රිතයන්, චිත්‍ර, සිනමාටෝග්‍රාෆ් කරන ලද සේයා පට, ශබ්ද පටිගත කිරීම් සහ වීඩියෝ පටිගත කිරීම් ඇතුළත් වේ. තවද 'පුස්තකාල සහ ප්‍රලේඛන සම්පත්' සහ 'පුස්තකාල හා ප්‍රලේඛන සේවා' යන යෙදුම් ඒ අනුව තේරුම් ගත යුතු ය.

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, (252 වන අධිකාරය වූ) මහ නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපිත යම් මහ නගර සභාවක්, (255 වන අධිකාරය වූ) නගර සභා ආඥා පනත යටතේ සංස්ථාපිත නගර සභාවක් හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපිත ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන හා ඉටු

කරනු ලබන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ :

"අමාත්‍යවරයා" යන්නෙන් අධ්‍යාපනය විෂයය පවරනු ලැබ ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයා අදහස් වේ:

"ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය" යන්නෙන් මේ පනත යටතේ පිහිටුවන ලද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය අදහස් වේ:

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVII අ පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ:

"ඉවත් කරන ලද පනත" යන්නෙන් 1970 අංක 17 දරන ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය පනත අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.